නාලන්දා විද්‍යාලය - කොළඹ 10.

NALANDA COLLEGE - COLOMBO 10

**33 | S | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2019

දෙවන වාර පරීක්ෂණය - 2018 මාර්තු

ගිණුම්කරණය - II

12 ශ්‍රේණිය

කාලය පැය $2\frac{1}{2}$

නම : ............................................................ පන්තිය : .......................... විභාග අංකය:..................

**උපදෙස්: පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

01. ජයසිකුරු වෙළඳසැලෙහි 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

(රු. 000)

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 1500 |
| ගොඩනැගිලි (පිරිවැය) | 1000 | - |
| මෝටර් රථ (පිරිවැය) | 800 | - |
| උපකරණ (පිරිවැය) | 300 | - |
| 2017.1.1 දිනට ක්ෂය වෙන්කිරීම් | | |
| ගොඩනැගිලි | - | 300 |
| මෝටර් රථ | | 160 |
| උපකරණ | | 90 |
| ගෙනයාමේ කුලී | 1 | |
| 2017.1.1 දිනට බඩු තොගය | 79 | |
| ණයගැතියෝ | 200 | |
| 2017.1.1 දිනට අඩමාන ණය වෙන්කිරීම් | | 5 |
| ගොඩනැගිලි කුලී ආදායම | | 120 |
| විදුලිය වියදම් | 31 | |
| වරිපනම් වියදම් | 6 | |
| වැටුප් හා වේතන | 90 | |
| දුන් වට්ටම | 7 | |
| අර්ථසාධක අරමුදල් | | 9 |
| විකුණුම් | | 2000 |
| ගැනුම් | 1400 | |
| 10% බැංකු ණය (වසර 5 කින් ගෙවිය යුතු) | | 500 |
| ණය වාරික | 150 | |
| ණයහිමියෝ | | 58 |
| බැංකු | 680 | |
| ලද වට්ටම | | 2 |
| | 4744 | 4744 |

**අතිරේක තොරතුරු :-**

1. 2017.12.31 දිනට තොගයෙහි පිරිවැය රු. 60000 කි. එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 58000-ක් යයි ඇස්තමේන්තු කර ඇත.
2. අවසාන ණයගැතියන් මත රු. 10000 බොල්ණය කපා හැර ඉතිරි ණයගැතියන් මත 5% ක අඩමාන ණය වෙන්කිරීමක් පවත්වාගෙන යාම ව්‍යාපාර ප්‍රතිපත්තිය වේ.

Scanned by CamScanner

3. 2017.12.31 දිනට විදුලිය රු. 3000 ක් හා වරිපනම් රු. 2000 ක් උපචිතව පැවතුනි.

4. ව්‍යාපාරය සේවක අර්ථසාධක අරමුදලට පිළිවෙළින් සේව්‍ය හා සේවක දයකය 15% ක් හා 10% ක් බැගින් ද සේවක භාරකාර අරමුදලට 3% බැගින් දයක වේ. සේවක වැටුප් ගෙවීමේදී සේවක දයකය [illegible] අර්ථසාධක අරමුදල් ගිණුමට බැර කිරීම හැර වෙනත් ගැලපුමක් කර නැත.

5. ව්‍යාපාර ගොඩනැගිල්ලෙන් කොටසක් 2017.7.1 දින සිට සණස සංවර්ධන බැංකුවට වසර 2 ක් සඳහා මුදල් එකවර ලබාගනිමින් කුලියට දෙන ලදී. ලද කුලිය කුලී ආදයම් ගිණුම බැර කර ඇත.

6. ව්‍යාපාරයේ වාර්ෂික ක්ෂය ප්‍රතිපත්තිය පහත පරිදි වේ.
   ගොඩනැගිලි පිරිවැය මත 5%
   මෝටර් රථ හීන වූ අගය මත 20%
   උපකරණ පිරිවැයට 10% බැගින් වේ.

7. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2017.1.1 දින දී ය. වාර්ෂික ණය වාරිකය ගෙවා ඇති අතර එය ණය වාරික ගිණුමට හර කර ඇත. වාරිකය තුළ ඇතුළත් පොලිය රු. 50000 කි.

**අවශ්‍ය වන්නේ :-**

(1) 2017.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදයම් ප්‍රකාශය

(2) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 50)

02. 2017 දෙසැම්බර් මාසයේ ශ්‍රීපති වෙළඳසැලෙහි ණයට විකුණුම් තොරතුරු සාරාංශය පහත දක්වේ.

(i)

| ණයගැතියා | විකුණුම් | ආපසු එවුම් | ලද මුදල් | වට්ටම් |
|---|---|---|---|---|
| රංගන | 40 000 | - | 36 000 | 4 000 |
| සසික | 30 000 | 5 000 | 40 000 | - |
| චමත් | 60 000 | - | 44 000 | 1 000 |
| විදුර | 20 000 | 2 000 | 16 000 | 2 000 |
| ටෙෂාන් | 60 000 | - | 35 000 | - |
| ජීවක | 28 000 | 6 000 | 20 000 | - |
| | 238 000 | 13 000 | 191 000 | 7 000 |

(ii) 2017 දෙසැම්බර් 01 දිනට ණයගැති ලෙජර ශේෂ පහත පරිදි විය.

| | |
|---|---|
| සසික | 20 000 |
| චමත් | 15 000 |
| ටෙෂාන් | 30 000 |
| ජීවක | 10 000 |
| සුමුදු | 5 000 |
| | 80 000 |

(iii) 2017. දෙසැම්බර් 31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ණයගැති ශේෂ ලැයිස්තුව එකතුව සමග එකඟ නොවීය. එයට හේතු පහත පරිදි විය.

A. ණයගැති පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු. 8000 ලෙස එම ගිණුමට උපුටාගෙන තිබුණි.

B. ණයගැති සුමුදුගේ ආරම්භක ශේෂය බොල්ණය ලෙස කපා හැරියද ඒ සඳහා පොදු ලෙජර සටහන යොද නැත.

C. ජීවක නැමති ණයගැතියා ආපසු එවන ලද භාණ්ඩ ඔහුගේ ගිණුම හර කර තිබුණි.

D. විකුණුම් ජ'නලයේ එකතුව රු. 328 000 ක් සේ සළකා පොදු ලෙජරයට වාර්තා කර ඇත.

E. වට්ටම් තීරුවේ එකතුව, ණයගැති පාලන ගිණුම හා ලද වට්ටම් ගිණුම් 2 බැර කර තිබුණි.

**අවශ්‍ය වන්නේ :-**

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් (සංලක්ෂ්‍ය සහිතව)
2. වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂය දැක්වෙන පරිදි අවිනිශ්චිත ගිණුම
3. එකිනෙක වැරැද්ද නිසා මාසයේ ලාභයට වූ බලපෑම දැක්වෙන ලේඛනය (පහත ආකෘතිය අනුව)

| වරද (අංකය) | ලාභයට වූ බලපෑම (වටිනාකම සහිතව) |
|---|---|
| | |

Scanned by CamScanner

2017 අප්‍රේල් මාසයේ බැංකු ගිණුම් විස්තරය අනුව බැංකු ගනුදෙනු පිළිබඳ පහත කරුණු හෙළිදරව් කරගත හැකිවිය.

(1) මාසය තුළ තැන්පත් කරන ලද 114501 දරන චෙක්පත ගිණුම් විස්තරයෙහි සඳහන්ව නැත.

(2) තැන්පත් කරන ලද 220301 චෙක්පත රු. 43000 ක් වුවද මුදල් ජ'නලය ඉලක්කම් මාරු කර ලියා ඇත.

(3) මාසය තුළ නිකුත් කළ A 200116 හා A 200117 චෙක්පත් බැංකුවට ඉදිරිපත් වී නැත.

(4) බැංකුව එකතු කරගත් ලාභාංශ රු. 3000 ක් ද ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 800 ක් බැංකු ප්‍රකාශනයේ සටහන්ව තිබුණි.

(5) 2017.4.1 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 46 000 ක් විය. එය බැංකු ගිණුමේ විස්තරයේ ආරම්භක ශේෂයට සමාන විය.

**අවශ්‍ය වන්නේ :-**

1. ව්‍යාපාරයේ පැවති මුදල් පාලන ගිණුම
2. සංශෝධිත මුදල් පාලන ගිණුම
3. 2017 අප්‍රේල් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය (ලකුණු 10)

(ආ) නිම්සරගේ ව්‍යාපාරයේ 2017 දෙසැම්බර් මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත දක්වේ. ව්‍යාපාරය සෑම මසකම අවසානයේ සුළු මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබයි.

| දිනය | වවුචර අංකය | ගනුදෙනුව |
|---|---|---|
| 17.12.2 | 20 | ලිපිද්‍රව්‍ය ගත්තා රු. 200 |
| 17.12.5 | 21 | ගමන් වියදම් ගෙව්වා රු. 400 |
| 17.12.8 | 22 | සංග්‍රහ වියදම් ගෙව්වා රු. 250 |
| 17.12.9 | 23 | කුලී රථ ගාස්තුව රු. 260 |
| 17.12.13 | 24 | පෑන් පැන්සල්, ලිපිගොනු කවර රු. 600 |
| 17.12.18 | 25 | කෙටි කෑම මිලට ගත්තා රු. 410 |
| 17.12.21 | 26 | ප්‍රවාහන ගාස්තු ගෙව්වා රු. 180 |
| 17.12.25 | 27 | ඡායා පිටපත් ගාස්තු ගෙව්වා රු. 160 |

2017.12.1 දිනට සුළු මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 3000 ක් විය.

**අවශ්‍ය වන්නේ :-**

1. 2017 දෙසැම්බර් මාසය සඳහා සුළු මුදල් ජ'නලය පිළියෙළ කරන්න.
   (විශ්ලේෂණය :- ලිපිද්‍රව්‍ය / ගමන් / සංග්‍රහ)
2. සුළු මුදල් ජ'නලය ලෙජරයට පිටපත් කිරීමේ පොදු ජ'නලය සටහන
3. පොදු ලෙජරයේ අදල ගිණුම් (ලකුණු 10)

Scanned by CamScanner

03. සමන් ජයසිංහ කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් "ඇග්‍රෝ මාට්" නමින් 2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලදි. ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු පහත දක්වේ.

| | |
|---|---|
| 2017.1.1 | සමන් රු. 200000 ක් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කරමින් ව්‍යාපාරය ආරම්භ කළා. |
| 2017.1.1 | කෘෂි රසායන අලෙවි බලපත්‍රය සඳහා රු. 3000 ක් ගෙව්වා. |
| 2017.1.2 | රු. 10000 ක මාසික කුලියකට කඩකාමරයක් ගත්තා. එදින ගෙවූ මුදල රු. 60000 කි. |
| 2017.1.4 | රු. 50000 ක් ගෙවා භාණ්ඩ ඇසිරීම සඳහා රාක්ක තොගයක් මිලට ගත්තා. |
| 2017.1.5 | රු. 70000 ක කෘෂි නිෂ්පාදන තොගයක් මිලට ගත්තා. |
| 2017.1.8 | රු. 40000 ක් පිරිවැය වූ තේ පොහොර තොගයක් රු. 60000 කට අමල් ද සිල්වාට අලෙවි කලා. |
| 2017.1.12 | රු. 5000 ක් පිරිවැය වූ පොහොර, වර්ගය වෙනස්වීම නිසා අමල් ආපසු එවා තිබුණා. |
| 2017.1.15 | අමල් පෙරේරාගෙන් ලැබිය යුතු මුළු මුදලම 10% ක වට්ටමකට යටත්ව මුදල් ලබාගත්තා. |
| 2017.1.20 | රු. 35000 ක රසායන ද්‍රව්‍ය තොගයක් ලංකෙම් සමාගමෙන් මිලට ගත්තා. |
| 2017.1.22 | රු. 7000 ක තොග කල් ඉකුත්වීම නිසා ලංකෙම් සමාගමට යැව්වා. |
| 2017.1.28 | සමන් නිවසේ මල්පැල සඳහා රු. 2000 ක් පිරිවැය වූ පොහොර රැගෙන ගියා. |

**අවශ්‍ය වන්නේ :-**

1. ඉහත ගනුදෙනු පහත දක්වෙන ගිණුම් සමීකරණයට කරන බලපෑම දක්වීම.

| දිනය | ප්‍රාග්ධනය + | ණයහිමියෝ | = ජංගම නොවන වත්කම් | + තොග | + ණයගැතියෝ | + බැංකු ගිණුම |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

2. ජනවාරි මාසය සඳහා ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය ගණනය කිරිම.
3. 2017 ජනවාරි 31 ට දක්වෙන පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 30)

04. (අ) ජයසිංහ වෙළඳසැල 2017 අප්‍රේල් මාසය සඳහා පිළියෙළ කළ මුදල් ලැබීම් හා ගෙවීම් ජ'නල පහත දක්වේ.

**මුදල් ලැබීම් ජ'නලය**

| දිනය | විස්තරය | | මුළු වටිනාකම | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වට්ටම් |
|---|---|---|---|---|---|---|---|
| 17.4.2 | විකුණුම් | (228001) | 100000 | 100000 | - | - | - |
| 17.4.3 | ණයගැති | (c123001) | 18 500 | - | 18 500 | - | 1500 |
| 17.4.8 | ණයගැති | (x220301) | 34 000 | - | 34 000 | - | - |
| 17.4.16 | පොලී | (488001) | 6 000 | - | - | 6 000 | - |
| 17.4.20 | ණයගැති | (332010) | 41 000 | - | 41 000 | - | - |
| 17.4.29 | විකුණුම් | (114501) | 50 000 | 50 000 | | | |
| | | | 249 500 | 150 000 | 93 500 | 6 000 | 1 500 |

**මුදල් ගෙවීම් ජ'නලය**

| දිනය | විස්තරය | | මුළු වටිනාකම | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වට්ටම් |
|---|---|---|---|---|---|---|---|
| 17.4.1 | ණයහිමි | (A200111) | 23 000 | - | 23 000 | - | 1 000 |
| 17.4.4 | ගැණුම් | (A200112) | 45 000 | 45 000 | - | - | - |
| 17.4.9 | ණයහිමි | (A200113) | 35 000 | - | 35 000 | - | - |
| 17.4.13 | විදුලිය | (A200114) | 8000 | - | - | 8 000 | - |
| 17.4.18 | ණයහිමි | (A200115) | 19 500 | - | 19 500 | - | 500 |
| 17.4.28 | ගැණුම් | (A200116) | 50 000 | 50 000 | - | - | - |
| 17.4.30 | ගොඩනැගිලි කුලී | (A200117) | 10 000 | - | - | 10 000 | - |
| | | | 190 500 | 95 000 | 77 500 | 18 000 | 1 500 |

Scanned by CamScanner

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00